# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2014 අප්‍රේල් මස 25 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 17.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු
(සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 24 වැනි දින]

එල්.ඩී.-ඕ. 4/2014

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2014 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

2002 අංක 14 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තිය, එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(ආ) නැවත අංකනය කළ එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඊ) මේ වගන්තියේ ඉහතින් ම වූ ඡේද යටතේ වන සැපයීම් ද පළමු උපලේඛනයේ II වන කොටස යටතේ නිදහස් කර ඇති සැපයීම් ද ඇතුළු යම් ලිත් වර්ෂයක යම් අනුක්‍රමික මාස තුනක කාලයක් සඳහා රුපියල් මිලියන දෙසිය පනහකට අඩු නොවන සමස්ථ සැපයුම් ප්‍රමාණයක් සහිත යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්;";

(ඇ) එම වගන්තියේ දෙවන අතුරුවිධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එසේම තවදුරටත්, (ඊ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ලියාපදිංචි තැනැත්තකුට අදාළ බදු පැනවීමේ හැකියාව 8 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීමට සහ එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් ව විය යුතු ය;";

2—PL 008088—2900 (2014/03)

(ඇ) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

''(2) (ඊ) ඡේදයේ කාර්ය සඳහා සම්පූර්ණ සැපයීම් යන්නෙන් -

(i) මේ පනතේ කාර්ය සඳහා එක් ලියාපදිංචියක් හෝ ලියාපදිංචි වීම් වැඩි ප්‍රමාණයක් යටතේ එක් ස්ථානයක දී හෝ විවිධ ස්ථානවල දී සමාන ස්වභාවයේ වෙනත් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන අතරතුර දී යම් තොග හෝ සිල්ලර වෙළඳාමේ යෙදී සිටින තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක; සහ

(ii) තොග හෝ සිල්ලර ව්‍යාපාරයේ යෙදී නොසිටින සමාගමක් හැර, තොග හෝ සිල්ලර ව්‍යාපාරයේ යෙදී සිටින පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් සම්බන්ධයෙන් වන විට, එම එක් එක් සමූහ සමාගමේ,

සම්පූර්ණ සැපයීම් වටිනාකම අදහස් වේ.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ ''ඒ මත කිසි බද්දක් අය නොකළ යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''ඒ මත කිසි බද්දක් අය නොකළ යුතු ය:

එසේ වුව ද, මේ පනතේ 3 වන වගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ශුන්‍ය අනුප්‍රමාණගත සැපයීම සහ ආනයනකරු විසින් ම සිදු කරනු ලබන අවස්ථාවක දී, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් වූ එම භාණ්ඩ සැපයුම්වල වටිනාකම හැර 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ පනතේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, එම ලියාපදිංචි තැනැත්තා විසින් ඍජුව ම හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කරන ලද සැපයුම් ද ඇතුළුව එම ලියාපදිංචි තැනැත්තාගේ සමස්ථ සැපයුම් වටිනාකමින් සියයට විසිපහක් ඉක්මවනු ලබන සැපයුම් වටිනාකම මෙම පනත

යටතේ එම ලියාපදිංචි තැනැත්තාගේ බද්දට යටත්වන සැපයුම් ලෙස සලකනු ලැබිය යුතු අතර, බදු ඇතුළත් ප්‍රතිශ්‍යාව මත බදු බන්ධය භාවිත කරමින් මේ පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ අනුව ඒ සඳහා බදු අය කළ යුතු ය:

එසේම තවදුරටත්,

(අ) මේ පනතේ පළමු උපලේඛනයේ II වන කොටසේ නිදහස් කරන ලද ලෙස නිශ්චිතව දක්වා ඇති ඖෂධ සපයනු ලබන; හෝ

(ආ) පරිගණක සහ පරිගණක උපාංග ද ඇතුළු මෘදුකාංග සම්බන්ධිත නිෂ්පාදන සපයනු ලබන,

මෙම අතුරුවිධානයේ පිළිවෙලින්, අවස්ථාවෝචිත පරිදි, (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ සැපයුම්වල සමස්ථ වටිනාකම සියයට හැත්තෑපහ ඉක්මවන යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම ලියාපදිංචි තැනැත්තා මේ වගන්තියේ දක්වා ඇති යම් බදු අයකිරීමට යටත් වන සැපයීම් ලෙස සැලකෙන සැපයීම් මත බද්දට යටත් නොවිය යුතු ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ ''රුපියල් මිලියන පන්සියයකට අඩු නොවන්නේ නම් මිස'' යන වචන වෙනුවට ''රුපියල් මිලියන දෙසිය පනහකට අඩු නොවන්නේ නම් මිස'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරුවිධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

''එසේම තවදුරටත්, මේ පනතේ 8 වන වගන්තියේ සඳහන් බදු අයකිරීමට යටත්වන සැපයීම් ලෙස සලකනු ලබන සැපයීම් මත කිසිදු බදු ඉන්වොයිස් පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, එහි (11) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(12) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ පොදු රක්ෂණ ව්‍යාපාරය යන ව්‍යාපාර දෙකම පවත්වාගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම තැනැත්තා විසින්, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තිය මගින් නියම කර ඇති ආකාරයට එම දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ පොදු රක්ෂණ ව්‍යාපාරය වෙනම සමාගම් දෙකක් බවට වෙන් කරනු ලබන අවස්ථාවක දී, එම වෙන්කරනු ලබන දිනයේ දී පොදු රක්ෂණ ව්‍යාපාරයට අදාළ අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බැරකම් ප්‍රමාණයේ යම් අතිරික්තයක් ඇත්නම් එම ප්‍රමාණය, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එහෙත් මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධානවලට යටත්ව, එම වෙන් කිරීමෙන් පසුව පොදු රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සමාගම විසින් සිදුකරන ලද අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බැරකමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ පිහිටුවන ලද යම් බැංකුවක හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ මූල්‍ය සමාගමක, අවස්ථාවෝචිත පරිදි, එම බැංකුව හෝ මූල්‍ය සමාගම අත්පත් කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම කරන ලද දිනයේ දී එම බැංකුවේ හෝ මූල්‍ය සමාගමේ බද්දට යටත් වන ව්‍යාපාරයට අදාළ යම් අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැරක් මේ පනතේ විධිවිධානවලට යටත්ව සහ තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව, ඉල්ලා සිටීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය, එහි (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

''(4) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මෙම පරිච්ඡේදය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද, එම තැනැත්තා විසින් -

(අ) 2014 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ ද 2003 ජූලි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් මාසයක් සම්බන්ධයෙන් තමා යටත් වන බදු ගණනය කිරීම සඳහා වූ ස්වකීය අභිප්‍රාය (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිත දැනුම් දීම යැවීමෙන් පසු කාලසීමාව කෙරෙහි (5) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ දැනුම් දීම අවලංගු කළ නොහැක;

(ආ) 2014 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන යම් මාසයක් සඳහා (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඈ වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඈ වගන්තියේ ''එසේ ගෙවන ලද බදු මුදලට සමාන මුදල් ප්‍රමාණයක බැර වාසියකට ඉඩ හැරිය යුතු යː'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2014 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ බදු අයකළ හැකි යම් කාලසීමාවක් සඳහා එසේ ගෙවන ලද බදු මුදලට සමාන මුදල් ප්‍රමාණයක බැර වාසියට ඉඩ හැරිය යුතු යː'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය එහි අතුරුවිධානයේ (iii) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේː-

''(iii) චංචල දේපළක් සම්බන්ධයෙන් වූ විට -

(අ) 2014 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන බදු අයකළ හැකි යම් කාලසීමාවක් සඳහා බදු අයකළ හැකි කාලසීමාවන් හතරකට වැඩි කාලයක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස්-ජනරාල්වරයා විසින් තෝරාගත යුතු බදු අයකළ හැකි කාලසීමාවන් හතරක්

පමණක් සඳහා වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙර වූ වටිනාකම සඳහා සද්භාවයෙන් ඇතිකරගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය;

(ආ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා බදු අයකළ හැකි කාලසීමාවන් වසර පහකට වැඩි කාලයක් සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක කොමසාරිස්-ජනරාල්වරයා විසින් තෝරාගත යුතු බදු අයකළ හැකි කාලසීමාව වසර පහක් පමණක් සඳහා වූ බදුවලට පැහැර හැරීමේ දිනයට පෙරාතුව වූ වටිනාකම සඳහා සද්භාවයෙන් ඇතිකරගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ii) අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ii) 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ දක්වා ඇති භාණ්ඩ ආනයනය මත රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අයකර එකතු කර ගන්නා බදු මුදලින් -

(අ) 2014 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාලසීමාව සඳහා සියයට දහයක්;

(ආ) 2014 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු කාලසීමාව සඳහා සියයට හයක්;,

එම මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර සහ ඉන්පසුව එළඹෙන එක් එක් මාසයේ,".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තියේ "ජාත්‍යන්තර ප්‍රවාහන සේවා" යන යෙදුමේ අර්ථකථනයේ (ඇ) ඡේදයට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈ) ගුවන් ප්‍රවාහනය මගින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් තොටුපළකින් ශ්‍රී ලංකාවේ වෙනත් ජාත්‍යන්තර ගුවන් තොටුපළකට;".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ කොටසේ (අ) ඡේදය -

(අ) (i) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) තිරිඟු, තිරිඟු පිටි හෝ කිරිපිටි;";

(ආ) (iii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iii) ආයුර්වේද ඖෂධ නිගන්ඩුවට අයත් ආයුර්වේදීය සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) ආයුර්වේදීය සංයෝග හෝ (රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ හඳුනාගත් සුවඳ විලවුන් සංයෝග නොවන) යුනානි, සිද්ධ හෝ හෝමියෝපති සංයෝග සහ ආයුර්වේද කොමසාරිස්වරයාගේ නිර්දේශය මත එවැනි සංයෝග සඳහා අමුද්‍රව්‍ය;";

(ඇ) (viii) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(viii) 2014 ජනවාරි මස 1 වන දිනයට පෙර කෘෂිකාර්මික ට්‍රැක්ටර් හෝ මාර්ග ට්‍රැක්ටර් සඳහා අර්ධ ට්‍රේලර්;";

(ඈ) (xxii) අයිතමයේ (vi) වන උපඅයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(vi) බවුසර්, බුල්ඩෝසර්, ග්‍රේඩර්ස්, ලෙවෙලර්ස්, එක්ස්කැවේටර් යන්ත්‍ර, ගිනි නිවීමේ රථ, ගලි බවුසර්, මාර්ග ට්‍රැක්ටර් සඳහා අර්ධ ට්‍රේලර් යන්ත්‍රෝපකරණ කැලි කසල ඉවත් කිරීමේ කාර්ය සඳහා භාවිත කරන යන්ත්‍රෝපකරණ හෝ කැලි කසල ප්‍රවාහනය කරන ට්‍රක් රථ;";

(ඉ) (vii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(viii) ටයිපටි සහ බෝපටි හෝ නිර්මාණාත්මකව සැලසුම් කළ පැන්.";

(ඊ) (xxiii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන්:-

"(xxiv) රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක යටතේ මුදවන ලද ඇම, බිලී කොකු, පිති, නූල් රෝල්, හඳුනාගත් ධීවර ආම්පන්න සහ සමුද්‍ර ප්‍රචාලන එන්ජින්;

(xxv) විදුලි සන්දේශ කර්මාන්තය සඳහා තඹ කම්බි රැහැන් -

-එම තඹ රැහැන් ශ්‍රී ලංකාවේ ලබා ගැනීමට නොමැති අවස්ථාවක දී ආනයනය කිරීමෙන්; හෝ

-දේශීය නිෂ්පාදකයකුගෙන් මිල දී ගැනීමෙන්.".

(2) ඒ කොටසේ (ආ) ඡේදයේ -

(i) (xiii) අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xiii) ආනයනය කළ පිරිසැකසුම් නොකළ දැව කඳන්, නැව්, වේවැල් හෝ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළඳ බද්දකට යටත්ව විකිණීම සඳහා කරන ලද සැකසීමක් හැර කිසිදු සකස් කිරීමකින් තොරව ආනයනකරු තමා විසින් ම ඒ භාණ්ඩ විකුණන බවට වූ කොන්දේසියට යටත්වන වෙනත් භාණ්ඩ;"

(ii) (xxxi) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xxxi) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්දට යටත්වන විදුලි සංදේශ සේවා;"

(iii) (xLvi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන් :-

"(xLvii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන තාක් දුරට ඩෙසිකේටඩ් පොල්, රබර්, රබර් කිරි, තේ දළු ඇතුළුව තේ, හාල්, හාල් පිටි, පාන්, බිත්තර, දියර කිරි;

(xLviii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන තාක් දුරට තේ හෝ රබර් නිෂ්පාදනය සඳහා වන යන්ත්‍රසූත්‍ර හෝ උපකරණ හෝ කෘෂිකාර්මික ට්‍රැක්ටර් හෝ අර්ධ ට්‍රේලර් සඳහා මාර්ග ට්‍රැක්ටර්;

(xLix) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය යටතේ ආදායම් බදු කාර්ය සඳහා නිදහස් කළ ශ්‍රී ලංකාවේ අලුතින් පිහිටුවන ලද ජාත්‍යන්තර ජාලයේ ආයතනවල යම් මූලස්ථානයක් හෝ කලාපීය ප්‍රධාන කාර්යාලයක් මගින් සිදු කරන සේවාවලට විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ලැබීම්;

(L) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ආයුර්වේද ඖෂධ නිගන්ඩුවට අයත් ආයුර්වේද නිෂ්පාදන හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) ආයුර්වේදීය සංයෝග හෝ (සුවඳ විලවුන් සංයෝග නොවන) යුනානි, සිද්ධ හෝ හෝමියෝපති සංයෝග.".

(3) ඒ කොටසේ (ඇ) ඡේදයේ (xvi) යන අයිතමයේ "හඳුනාගත් කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ඇතිව කර්මාන්ත ශාලා අයිතිකරුවන් විසින් කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා යොදන යන්ත්‍ර" යන වචන වෙනුවට "2014 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව හඳුනාගත් කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ඇතිව කර්මාන්තශාලා අයිතිකරුවන් විසින් කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා යොදන යන්ත්‍ර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන පොදු සංශෝධන.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ -

(අ) ''කොමසාරිස්වරයා'' යන වචනය යෙදී ඇති සෑම ස්ථානයකම ''ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයා'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ''නියෝජ්‍ය කොමසාරිස්වරයා'' යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ''කොමසාරිස්වරයා'' යන වචනය ආදේශ කිරීමෙන්;

(ඇ) ''ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු'' යන වචන යෙදී ඇති සෑම ස්ථානයකම ''නියෝජ්‍ය කොමසාරිස්වරයා'' හෝ ''ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයා''යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ''තක්සේරුකරු'' යන වචනය යෙදී ඇති සෑම ස්ථානයකම "තක්සේරුකරු" හෝ ''සහකාර කොමසාරිස්වරයා'' යන වචන ආදේශ කිරීමෙන්.

වලංගු භාවය

**14.** 2014 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු රැස්කිරීමට බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි අධිකාරී බලය සහිතව ක්‍රියාකර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම වලංගු ලෙස සිදුකර ඇති හා සිදුව ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු එකතු කිරීම සම්බන්ධයෙන් උපචිත විය හැකි සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් එම තැනැත්තා මෙයින් හානිපූරණය කරනු ලැබේ:

එසේ වුව ද, එම කාලසීමාව තුළ දී මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බදු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ නියෝගයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බලනොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.